# 11 ශ්‍රේණිය

# ගෘහ ආර්ථික විද්‍යාව

## පෙරහුරු අභ්‍යාස

නිපුණතාව- 10

ගෘහීය අවශ්‍යතා සඳහා නිර්මාණ සකස් කිරීමේ දී විවිධ මැහුම් ක්‍රම යොදා ගනියි.

නිපුණතාව 11

පුද්ගල අවශ්‍යතා සඳහා රෙදි වර්ග හඳුනාගෙන ඇඳුම් නිර්මාණය කරයි.




එම්.ඒ.රේණුකා පී. පෙරේරා මිය. විශ්‍රාමික ගුරු උපදේශක

කලාප අධ්‍යාපන කාර්යාලය. මිනුවන්ගොඩ.

ඔබේ 11 ශ්‍රේණිය පෙළ පොතේ 10 ගෘහ පිළිනිර්මාණ පාඩම සහ 11 මුල්ළමා වියෙහි දරුවෙකු සඳහා ගවුමක් නිර්මාණය කිරීම යන පාඩම් අධ්‍යයනය කර පහත අභ්‍යාස වලට පිළිතුරු සපයන්න.

1. ඉඳිකටුව වටා එක් වරක් නූල පටලවා, ඉඳිකටුව ඇද, මැස්ම අදාළ ස්ථානයට ගෙන මසනුයේ,

(1) සැටින් මැස්ම ය. (2) ප්‍රංශ ගැට මැස්ම ය.

(3) බූලියන් මැස්ම ය. (4) ලේසිඩේසි මැස්ම ය.

2. මැස්මෙහි සමානතාවයක් පෙන්නුම් කරන විසිතුරු මැස්ම දෙකක් වන්නේ,

(1) කතිර මැස්ම හා නැටි මැස්ම ය. (1) දම්වැල් මැස්ම හා සැටින් මැස්ම ය.

(2) හුරුළුකටු මැස්ම හා සැටින් මැස්ම ය. (3) කතිර මැස්ම හා හුරුළුකටු මැස්ම ය.

3. ළමා ගවුමේ ඉදිරිපස කඳ කොටස අලංකාර කිරීමට ආරෝපණ ක්‍රමය යොදා ගන්නේ නම්, එය මැසීම සඳහා වඩාත් සුදුසු මැහුම් ක්‍රමය වන්නේ,

(1) බ්ලැන්කට් මැස්ම ය. (2) කතිර මැස්ම ය.

(3) හුරුළුකටු මැස්ම ය. (4) දම්වැල් මැස්ම ය .

4.එළලීම හා අණ්ඩ දැමීම යන මැසීමේ ශිල්පීය ක්‍රමයන්,

(1) ඇඳුම් අලංකාර කිරීමේ ක්‍රමයන් වේ.

(2) ඇඳුමේ ගුණාත්මක බව වැඩිකිරීමේ ක්‍රමයන් වේ.

(3) ඇඳුම් අලුත්වැඩියා කිරීමේ ක්‍රමයන් වේ.

(4) ළමා ඇඳුමට නව පෙනුමක් ලබා දෙන ක්‍රමයන් වේ.

5. ළමා ගවුම මැසීමට සුදුසු රෙදි වර්ගයකි .

(1) මල් රෙදි (2) නෙන්සුක් රෙදි

(3) පොප්ලින් රෙදි (4) අමු රෙදි

6. ඇඳුමක වාටියක් අලංකාරව නිම කිරීමට යොදා ගත හැකි මැස්මක් වන්නේ,

(1) පිස්මේන්තු මැස්ම ය. (2) ගැට පිස්මේන්තු මැස්ම ය.

(3) සන්නාලි මැස්ම ය. (4) සැඟි වාටි මැස්ම ය.

7.සේයා මැස්ම සඳහා යොදා ගනු ලබන්නේ,

(1) සැටින් මැස්ම ය. (2) හුරුළුකටු මැස්ම ය.

(3) කතිර මැස්ම ය. (4) දිග කොට මැස්ම ය.

8.බන්දේසි කවරයක් අලංකාර කිරීම සඳහා වර්ණවත් රෙදි කොටස් මෝස්තරයකට අනුව තබා මැසීම හඳුන්වන්නේ,

(1) එම්බ්‍රොයිඩර් කිරීම ලෙස ය. (2) ක්විල්ට් කිරීම ලෙස ය.

(3) ආරෝපණය කිරීම ලෙස ය. (4) අක් සැරසිලි යෙදීම ලෙස ය.

9.කුෂන් කවරයක ඉදිරිපස හා පිටුපස පළුව මූට්ටු කිරීම සඳහා වඩාත් සුදුසු වන්නේ,

(1) සරල මූට්ටුව සහ ප්‍රංශ මූට්ටුව ය. (2) පැතලි මූට්ටුව සහ අතිඡාදන මූට්ටුව ය.

(3) විවෘත පැතලි මූට්ටුව සහ පැතලි මූට්ටුව ය. (4) ප්‍රංශ මූට්ටුව සහ අතිඡාදන මූට්ටුව ය.

10.බන්දේසි කවරයක් හෝ කුෂන් කවරයක් මැසීමට වඩාත් සුදුසු රෙදි වර්ගය දැක්වෙන කාණ්ඩය වන්නේ,

(1) අමු රෙදි ,රෙජ් සහ රෙයෝන් ය. (2) කපු ,සේද සහ පොලියෙස්ටර් ය.

(3) සේද ,රෙයෝන් සහ අමු රෙදි ය. (4) රෙජ් , පොප්ලින් සහ අමු රෙදි ය.

11. ළමා ගවුමේ පිටුපස විවරය පියවීමට වඩා සුදුසු ක්‍රම වන්නේ,

(1) බොත්තම්, කාස මැසීම හා වෙල්කො ටේප් ඇල්ලීම .

(2) දෙපෙති ජන්තු ඇල්ලීම සහ හක්ක, මුදු ඇල්ලීම.

(3) සැන ගාන්චු ඇල්ලීම සහ දෙපෙති ජන්තු ඇල්ලීම .

(4) බොත්තම් කාස මැසීම සහ දෙපෙති ජන්තු ඇල්ලීම.

12



ඉහත දැක්වෙන මෝස්තර මැසීම සඳහා වඩාත් සුදුසු මැහුම් ක්‍රම වන්නේ,

(1) බූලියන් මැස්ම, ලේසි ඩේසි මැස්ම හා නැටි මැස්ම ය .

(2) නැටි මැස්ම ,දම්වැල් මැස්ම හා බූලියන් මැස්ම ය.

(3) ලේසි ඩේසි මැස්ම ,නැටි මැස්ම හා ප්‍රංශ ගැට මැස්ම ය.

(4) ප්‍රංශ ගැට මැස්ම ,දම්වැල් මැස්ම සහ පිස්මේන්තු මැස්ම ය.

13 ළමා ගවුමේ ඉදිරිපස කඳ කොටසෙහි මූලික පතරොම ගොඩනැගීම සඳහා, දෙවන හරස් මිම්ම සළකුණු

කරනුයේ ,කරේ ගැඹුරේ සිට

(1) සෙන්ටි මීටර 3 ක් පහළිනි (2) සෙන්ටිමීටර් 3.5 ක් පහළිනි

(3) සෙන්ටිමීටර් 4 පහළිනි (4) සෙන්ටි මීටර් 4.5 ක් පහළිනි

14.ළමා ගවුමෙහි කඳ කොටස මැසීමේදී පළමුව කළ යුතු වන්නේ,

(1) ආර මැසීම ය (2) උරහිස් මූට්ටු කිරීම ය

(3) විවර මැසීම ය (4) අංශය මැසීම ය

15.ළමා ගවුමේ කඳ කොටසට ශක්තිමත් බවක් ලබා දීමට කළ යුතු වන්නේ

(1) ක්විල්ට් කිරීම ය (2) පෝරුවක් ඇමීම ය .

(3) හැඩ පෝරුව ඇමීම ය. (4) ආරෝපණය කිරීම ය .

16.පහත සඳහන් මිනුම් අතුරෙන් ඍජු මිනුමක් වන්නේ,

(1) ආර මිනුම හා කර වටා මිනුමය . (2) උරහිස් මිනුම හා අංශ මිනුම ය.

(3) ඉන මිනුම හා ආර මිනුම ය. (4) පපුව මිනුම හා අංශ මිනුම ය .

17.මූට්ටුවක නොමැසූ අද්දර නිම කිරීමට යොදා ගත හැකි මැහුම් ක්‍රමයකි.

(1) කතිර මැස්ම (2) බ්ලැන්කට් මැස්ම (3) හුරුළුකටු මැස්ම (4) සැගි වාටි මැස්ම

18 මැසීමේ ශිල්පී ක්‍රම වලට අයත් වනුයේ,

(1) බඳන යෙදීම , පිහිතල පොලොව් සහ නූල් ඇදීමය.

(2) පිහිතල පොලොව්, දම්වැල් මැස්ම සහ කතිර මැස්මය.

(3) සිහින් රැළි ,බඳන යෙදීම සහ පිහිතල පොලොව් ය.

(4) නූල් ඇදීම ,සිහින් රැළි සහ වාටි මැස්ම ය.

19 නිර්මාණයක් සඳහා බොත්තම් හා කාසය මැසීමේදී කාසය මසනු ලබන්නේ,

(1) නිර්මාණයකට අනුව ය. (2) යටවෙන කොටසය.

(3) මතුවන කොටසටය. (4) ඕනෑම කොටසකට යෙදිය හැක.

20.අතේ මැහුම් මැසීමේ දී දිදාලයක් භාවිත කරන්නේ,

(1) ක්‍රමානුකූලව මැස්ම මසා ගෙන යාමට ය. (2) වඩා ඉක්මනින් මැසීමට ය.

(3) නූල පහසුවෙන් ඇද ගැනීමට ය. (4) ඉඳිකටුවට තෙරපුමක් ලබා දීමටය.

## ව්‍යුහගත ප්‍රශ්න

01

i ඔබේ විසිත්ත කාමරය හා නිදන කාමරය සඳහා භාවිත වන ගෘහ පිළි වර්ග තුන බැගින් සඳහන් කරන්න. (ලකුණු 03යි)

ii කුෂන් කවරයක් මැසීමේදි අනුගමනය කළ යුතු පියවර ගැලීම් සටහනකින් ඉදිරිපත් කරන්න. (ලකුණු 03යි)

iii බන්දේසි කවරයක් මැසීම සඳහා පිරිසැලසුමක් සකස් කිරීමේදී එයට ඇතුලත් විය යුතු කරුණු හතරක් සඳහන් කරන්න. (ලකුණු 04යි)

( මුළු ලකුණු 10යි)

02

i ළමා ගවුමක තිබිය යුතු ලක්ෂණ තුනක් සඳහන් කරන්න. (ලකුණු 03යි)

ii ළමා ගවුමෙහි මූලික අතෙහි දළ සටහනක් පහත දක්වා ඇත. පහත අක්ෂර වලින් දක්වන මිනුම් සෙන්ටිමීටර් වලින් දක්වන්න.




(a) A සිට B දක්වා

(b) B සිට C දක්වා

(c) C සිට E දක්වා (ලකුණු 03යි)

iii ළමා ගවුමෙහි කඳ කොටසහි පතොරම රෙද්ද මත ඇතිරීමේදී අනුගමනය කළ යුතු පියවර හතරක් සඳහන් කරන්න.

(ලකුණු 04යි)

( මුළු ලකුණු 10යි)

# පිළිතුරු

## බහුවරණ පත්‍රය

| | | | |
|---|---|---|---|
| 1 - 2 | 6 - 2 | 11 - 4 | 16 -2 |
| 2 - 4 | 7 – 2 | 12- 3 | 17 -2 |
| 3 – 1 | 8 – 3 | 13 - 3 | 18 -3 |
| 4 - 3 | 9 - 1 | 14 –1 | 19 -3 |
| 5 -3 | 10 -4 | 15 -2 | 20-4 |

## ව්‍යුහගත

01

i

- විසිත්ත කාමරය - කුෂන් කවර ,පුටු කව, ටීපෝ / ස්ටූල් කවර,ඩොයිලි .................
- නිදන කාමරය - ඇඳ ඇතිරිලි ,ඇඳ ආවරණ ,මෙට්ට කවර ,කොට්ට උර ,මදුරුදැල් ජනේල/ දොර තිරරෙදි…………………….. (ලකුණු 03යි)

ii අවශ්‍ය දිග පළල අනුව රෙද්ද කපා ගැනීම

↓

ඉදිරිපසඅලංකාරය වීම සඳහා සුදුසු මෝස්තරයක් පිටපත් කිරීම

↓

විසිතුරු මැහුම් ක්‍රම මගින් මෝස්තර මසා ගැනීම

↓

පෝරුවක් යෙදීම

↓

පිටුපස විවර ය මැසීම

↓

ඉදිරිපස හා පිටුපස මූට්ටු කිරීම

↓

නොමැසූ අද්දර නිම කිරීම

↓

උචිත පියවීමේ ක්‍රමයකින් විවරය පියවීම (මූලික කරුණු 3කට ලකුණු 03 යි)

iii

- බන්දේසි කවරයේ දිග, පළල හෝ හැඩය පිළිබඳ බැලීම .
- එයට පතරොමක් නිර්මාණය කිරීම.
- විසිතුරු කිරීමට සුදුසු මෝස්තරයක් තෝරා, යොදන ස්ථානය තීරණය කිරීම .
- මැසීමට යොදා ගන්නා මැහුම් ක්‍රම තේරීම .
- අවශ්‍යා රෙදි වර්ගය, ප්‍රමාණය, නූල් වල වර්ණය ඉඳිකටු වල ප්‍රමාණය තීරණය කිරීම .
- පෝරුවක් යෙදීම .
- අද්දර නිම කිරීමේ ක්‍රම හා නිමාව. (කරුණු 4කට ලකුණු 04 යි)

( මුළු ලකුණු 10යි)

02

i

- ඇඟ ලීමට හා ගැලවීමට පහසු වීම
- උචිත පියවීමේ ක්‍රම යොදා ගැනීම
- ලිහිල් වීම
- විසිතුරු හා අලංකාර වීම
- උචිත පන්නයක් වීම
- සේදීමට හා මැදීමට ඔරොත්තු දීම
- ඇඳුමෙහි මූට්ටු හා නිමාව දරුවාට අපහසු නොවීම (කරුණු 3ට ලකුණු 03 යි)

ii (a) සෙන්ටිමීටර් 25

(b) සෙන්ටිමීටර් 12

(c) සෙන්ටිමීටර් 05 (ලකුණු 03 යි)

iii

- පතරොමෙහි මැද නැම්ම,රෙද්දේ නැම්මට තිබීම.
- රෙද්දෙහි දිගත් රේඛාවට සමාන්තරව පතරොමෙහි උස සිටින ලෙස තැබීම .
- පතරොම රෙද්දෙහි නොපිටින් ඇතිරීම .
- පළමුව කඳ කොටසෙහි ඉදිරිපස හා පිටුපස කොටස් අතුරා දෙවනුව අත් කොටස් ඇතිරීම.
- පතරොම රෙද්ද ඇතිරීමෙන් පසු අල්පෙනෙති ගැසීම. (කරුණු 4කට ලකුණු 04 යි)

( මුළු ලකුණු 10යි)